# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2473/17 - 2026 ජනවාරි මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2026.01.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**කෙටුම්පත**

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත

**8 වගන්තිය යටතේ වූ නියෝග**

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 8 වෙනි වගන්තිය අනුව, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත පැවරී ඇති බලය යටතේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙනුවෙන් එහි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජෙනරල් කපිතාන් දමින්ද රඹුක්වැල්ල වන මම, මෙහි I වෙනි උපලේඛනයේ නම් සඳහන් ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු වෙත II වෙනි හා III වෙනි උපලේඛනවල සඳහන් දේපළ, මෙහි IV වන උපලේඛනයේ සඳහන් නියමයන් හා කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය හා I වෙනි උපලේඛනයේ නම සඳහන් ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු අතර ඇති කර ගන්නා ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට බලපැවැත්වෙන පරිදි, සිවිල් ගුවන්සේවා කටයුතු වෙනුවෙන් පරිහරණය සඳහා ලබා දීමට මෙයින් නියම කරමි. එකී;

**I වෙනි උපලේඛනය**
ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

**II වෙනි උපලේඛනය**
පහත සඳහන් ගුවන්තොටුපලවල් සඳහා වූ ඉඩම්

- කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල
- රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපල
- මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපල
- යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපල


1A - G 46194 — 04 (2026/01)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**III වෙනි උපලේඛනය**

පහත සඳහන් ගගන නාවික සේවා පහසුකම් සඳහා වූ ඉඩම්

- රත්මලාන, කඳවල පාරේ පිහිටි සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම
- රත්මලාන, අත්තිඩියේ පිහිටි ගගන නාවික සන්නිවේදන සම්ප්‍රේෂණාගාරය, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සඳහා ගම්පහ, මඩම්පැල්ලේ පිහිටුවා ඇති ගුවන් විදුලි සංතරණ උපකාරක, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි ධාවන පථය සඳහා ගම්පහ, පමුණුගම, කැපුන්ගොඩ පිහිටුවා ඇති ගුවන් විදුලි සංතරණ උපකාරක, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම
- පිදුරුතලාගල කන්දේ පිහිටුවා ඇති රේඩාර් ස්ථානය, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම
- ගුවන්සේවා කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු නිකේතනය ඉදිකර තිබෙන නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිදුරුතලාගල පිහිටි ඉඩම එහි ඇති හෝ ඊට ආබද්ධ කවර හෝ ඉදිකිරීම් ද ඇතුළුව

**IV වෙනි උපලේඛනය**

රෙගුලාසි සහ කොන්දේසි

1. ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) මෙම *ගැසට් නිවේදනය* ප්‍රකාශයට පත් කිරීමෙන් පසු හැකි ඉක්මණින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරල් සමග එකිනෙක දේපළ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹිය යුතුය.

2. එකී ගිවිසුම නිසි පරිදි අත්සන් කළ දින සිට මෙම නියමය ක්‍රියාත්මක වේ.

3. සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා විසින් පනවන ලද පහත සඳහන් නියෝගවලට අනුකූලව ගුවන්තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම (AASL) කටයුතු කළ යුතුය.

   I. *අති විශෙෂ ගැසට්* අංක 2422/38 හා 2025/02/06 දිනැතිව පළ කරන ලද අංක 01 දරන නියෝගය.

   II. *අති විශෙෂ ගැසට්* අංක 2422/39 හා 2025/02/06 දිනැතිව පළ කරන ලද අංක 02 දරන නියෝගය.

4. ශ්‍රී ලංකා ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) විසින් නියමයේ සඳහන් කර ඇති නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරනු ලැබීමත්, ඒ නිශ්චල දේපළ හෝ ගගන යාත්‍රාංගන හෝ මනා තත්ත්වයෙන් තබා ගැනීම සහ නඩත්තු කරනු ලැබීමත් කළ යුතුය.

5. සිවිල් ගුවන්සේවා අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය නොලබා යම් දේපලක හෝ ගගන යාත්‍රාංගනයක හෝ යම් වෙනස් කිරීමක් සිදු කිරීම හෝ ඒ දේපළ තුළ අළුතින් ඉදිකිරීම් කිසිවක් කිරීම හෝ එම දේපළක් හෝ ගගන යාත්‍රාංගනයක් හෝ කිසිවෙකුට බදු දීම නොකළ යුතුය.

**කපිතාන් දමින්ද රඹුක්වැල්ල,**
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් හා
ප්‍රධාන විධායක නිලධාරී.

2026 ජනවාරි මස 07 වැනි දින,
නො. 152/1 මීනුවන්ගොඩ පාර,
කටුනායක.

EOG 01 - 0279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.